මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477421 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2026.09.15 |

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2026 අගෝස්තු

## 2026 අගෝස්තු මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන සහ සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි

**නිෂ්පාදන අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2026 අගෝස්තු මාසයේ දී දර්ශකාංක 53.0ක අගයක් වාර්තා කළේය.** පසුගිය මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වුවද, නිෂ්පාදන ක්‍රියාකාරකම්වල වර්ධනයක් මෙමගින් පෙන්නුම් කරයි. නිෂ්පාදන උප දර්ශකය හැර අනෙකුත් සියලුම උප දර්ශක අගයන් අගෝස්තු මාසය තුළ දී කඩඉම් මට්ටමට වඩා ඉහළින් පැවතුණි.

| | |
|---|---|
| නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය<br>2026 අගෝස්තු | 53.0 |

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අගෝස්තු මාසයේ දී නව ඇණවුම් උප දර්ශකය කඩඉම් මට්ටමේ ම පැවති අතර, එමගින් නව ව්‍යාපාරික ක්‍රියාකාරකම් බොහෝ දුරට නොවෙනස්ව පවතින බව පෙන්නුම් කරයි. මේ අතර, නිෂ්පාදන උප දර්ශකයේ මන්දගාමී වීමට, රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදන අංශය ප්‍රධාන වශයෙන් හේතු විය. වසර අවසාන උත්සව සමයේ නිෂ්පාදන කටයුතු වෙනුවෙන් සිදුකරන අඛණ්ඩ සේවක බඳවා ගැනීම් සහ ක්‍රමික තොග රැස් කර ගැනීම් පිළිබිඹු කරමින්, අගෝස්තු මාසයේ දී සේවා නියුක්ති සහ තොග මිලදී ගැනුම් යන උප දර්ශක දෙකම ඉහළ ගියේය. මේ අතර, පවතින සැපයුම් බාධාවන් පිළිබිඹු කරමින්, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය අගෝස්තු මාසයේ දී තවදුරටත් ඉහළ ගියේය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | 2026 ජූලි | 2026 අගෝස්තු | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **55.0** | **53.0** | - | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| නව ඇණවුම් | 55.9 | 50.0 | - | ඉහළ යෑමක සිට කඩඉම් මට්ටමට පැමිණීමක් |
| නිෂ්පාදන | 54.5 | 48.4 | - | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| සේවා නියුක්තිය | 51.0 | 54.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 51.5 | 54.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 61.5 | 63.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කාලීන අභියෝග හමුවේ යම් තරමකට මන්දගාමී වුවද, වසර අවසාන උත්සව සමය හේතුවෙන් නිෂ්පාදන අංශයේ ඉදිරි අපේක්ෂා තවදුරටත් ධනාත්මක මට්ටමක පවතියි.

### ගෝලීය ප්‍රවණතා
### නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්

| රට / කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | සමාන වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 සැප්. 15 වන දිනට (PMI Releases (spglobal.com))*

*[1] එස් &පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, පෙර මාසයට සාපේක්ෂව සේවා ක්‍රියාකාරකම්වල වේගවත් වර්ධනයක් පෙන්නුම් කරමින්, 2026 අගෝස්තු මාසයේ දී දර්ශකාංක 65.6ක අගයක් වාර්තා කළේය.**

බොහෝ සේවා අංශවල දක්නට ලැබුණු වැඩිදියුණු වීම්වල සහාය ඇතිව, 2026 අගෝස්තු මාසයේ දී සේවා අංශයේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් වේගයෙන් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් ප්‍රවාහනය, තොග හා සිල්ලර වෙළඳාම, සහ වෘත්තීය සේවා යන උප අංශයන්හි ශක්තිමත් ක්‍රියාකාරිත්වය මෙම ප්‍රසාරණය සඳහා දායක වූ අතර, මූල්‍ය සහ අනෙකුත් පෞද්ගලික සේවා උප අංශ ද සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය.

2026 අගෝස්තු මාසයේ දී නව ව්‍යාපාර වර්ධනය වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් තොග හා සිල්ලර වෙළඳාම, සහ මූල්‍ය සහ අනෙකුත් පෞද්ගලික සේවා උප අංශයන්හි ඉහළ යෑම් බලපෑවේය. වෘත්තීය සේවා උප අංශය ද මෙම ඉහළ යෑමට ධනාත්මක දායකත්වයක් ලබා දුන්නේය.

නව සේවක බඳවා ගැනීම්වල සහාය ඇතිව, 2026 අගෝස්තු මාසයේ දී සේවා නියුක්තිය ඉහළ ගියේය. මේ අතර, නිම කිරීමට ඉතිරිව ඇති කාර්යයන් ප්‍රමාණය පෙර මාසයේ වාර්තා වූ ඉහළ යෑම ආපසු හරවමින්, 2026 අගෝස්තු මාසයේ දී පහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | 2026 ජූලි | 2026 අගෝස්තු | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)** | **61.4** | **65.6** | + | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| නව ව්‍යාපාර | 60.2 | 60.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 52.9 | 53.3 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිම කිරීමට නියමිත කාර්යයන් | 51.2 | 48.3 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 75.0 | 71.7 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අපේක්ෂිත ආර්ථික වැඩිදියුණු වීම් සහ සංචාරක පැමිණීම්වල අපේක්ෂිත වර්ධනයේ සහාය ඇතිව, ඉදිරි කාර්තුව සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් 2026 අගෝස්තු මාසයේ දී ධනාත්මකව පැවතුණි. කෙසේ වෙතත්, පුළුල් ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා ඉදිරි දැක්ම කෙරෙහි අහිතකර අවදානම් තවදුරටත් එල්ල කරයි.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**

**65.6**

**2026 අගෝස්තු**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | අඩු වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 සැප්තැම්බර් 15 වන දිනට*

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ හරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිම කිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.